# ඉස්ලාම් ආගම

සැකසුම:
අබූ ෂාෆරා මුහම්මදු හුසෙයින්

Sinhali

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بسلطانة
تحت إشراف وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد
هاتف ٤٢٤٠٠٧٧ ناسوخ ٤٢٥١٠٠٥ ص ب ٩٢٦٧٥ الرياض ١١٦٦٣ بريد إلكتروني E.mail : Sultanah22@hotmail.com
THE COOPERATIVE OFFICE FOR CALL & FOREIGNERS GUIDANCE AT SULTANAH
Tel:4240077 Fax:4251005 P.O.Box:92675 Riyadh:11663 K.S.A. E-mail: sultanah22@hotmail.com

# دين الإسلام

تأليف: أبو شاعره محمد حسين

# ඉස්ලාම් ආගම


සැකසුම:

අබූ ෂාඉරා මුහම්මදු හුසෙයින්



කැඳවීමේ හා මඟපෙන්වීමේ සහයෝගී කාර්යාලය

අල්-රව්දා - සමාජ ඒකකය - රියාද්

සවුදි අරාබියාව. දුර කථනය : 4918051

ⓒ مكتب توعية الجاليات بالروضة ، ١٤٢٠هـ

*فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر*

حسين ، أبو شاعرة حماد

دين الإسلام - الرياض .
٢٠ ص ؛ ١٢ × ١٧ سم
ردمك ٦ - ٦ - ٩١٩٣ - ٩٩٦٠
(النص باللغة السنهالية)

١- الإسلام ٢- الألوهية أ- العنوان

ديوي ٢٤٠ ٢٠/١٠١٦

رقم الايداع : ٢٠/١٠١٦
ردمك : ٦ - ٦ - ٩١٩٣ - ٩٩٦٠

## මහා දයාන්විත මහා කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙන්

වත්මන් ලොවෙහි ජනයන් අතර ඉස්ලාම් දහම ගැන දැනුම ඇත්තේ ඉතා සුළුවෙනි. ඉස්ලාම් යනු කුමක්ද? එය කුමණ මාදිලියේ ආගමක්ද? එහි ප්‍රතිපත්තීන් හා පරමාර්ථයන් කුමක් ද? යන්න දැනගැනීම ඔබගේ පරම යුතුකම නොවේද?

බුද්ධාගම බුදුන් වහන්සේගේ නමින්ද, ක්‍රිස්තියානි ආගම ක්‍රිස්තුස් වහන්සේගේ නමින්ද, කොන්ෆියුසියස් ආගම එහි නිර්මාතෘවරයාගේ නමින් ද, හින්දු සහ යුදෙව් ආගම ඒ ඒ ආගම් උපත ලැබූ සමාජයේ නමින් ද ව්‍යවහාරය වේ.

ඉස්ලාම් ආගම එවැනි ආගමක් නොවේ. ඉස්ලාම් යනු අරාබි වචනයකි. එයට අවනතවීම, යටත්වීම සහ කීකරු වීම වැනි අරුත් කීපයකි. ශාන්තිය හා සමාදානය යනුවෙන් ද අරුතක් වේ. මෙම ඉස්ලාම් ආගම මිනිසාගේ එලොව

මෙලොව යහපත් උදෙසා සර්ව බලධාරි දෙවියා වූ අල්ලාහ් විසින් පිරිනමන ලද සත්‍ය ආගමකි. යමෙකු අල්ලාහ්ගේ ආඥාවන් පිළිපැද අල්ලාහ්ට සම්පූර්ණයෙන් කීකරු වී ජීවත්වන්නේ නම්, ඉස්ලාමීය නීතිරීතින් අනුව ක්‍රියා කරන්නේ නම් හෙතෙම අල්ලාහ්ගේ කීකරු අනුවැසියෙකු බවට පත්වී අත්විතීය මනහර ප්‍රති විපාකයක් ලබන්නේය.

ඉස්ලාම් ආගම දෙවියන් කීපයක් ඇදහීම කිසිසේත් නොපිළිගනී. පිළිම, පින්තූරු, ගින්න, ඉර, සඳ, තාරකාවන් සහ මිනිසා විසින් තනන ලද මද් හට ගරු බුහුමන් කිරීම වැනි වන්දනා මාන තරයේ හෙළා දකී. අල්ලාහ් වැඳ පුදා ගැනීම පිණිස තෙල්, මල්, පහන්, සඳුරු සහ හඳුන් කූරු වැනි කිසිවක් උවමනා නැත. පහණක් දැල්වීමට උවමනා නැත. මිනිසුන් අභියස හිස නැමීමක් හෝ පාමුල වැඳ වැටීමක්ද හෝ ඉස්ලාම් ආගම කිසිවිටෙක අනුමත නොකරයි. ඇත්තේ එකම එක දෙවියා අල්ලාහ් පමණකි. එකම එක මිනිස් සමාජයකි. එම නිසා මුලු

මිනිස් සමාජයම අවනත විය යුත්තේ සර්ව බලධාරි දෙවියා වූ අල්ලාහ්ට පමණී.

එසේම ඉස්ලාම් දහම සත්වැනි සතවර්ශයේ ජීවත්වූ මුහම්මද් තුමා විසින් ගෙන එනු ලැබූ ආගමක්ද නොවේ. ඉස්ලාම් ආගම මහම්මදාගම යනුවෙන් පැවසීමද අනුවණේ ශිකරය වේ. එතුමා මගින් අල්ලාහ් විසින් පිරිනමන ලද දිව්‍යාගමකි. (මුහම්මද් තුමා දෙවියෙක් නොවේ. එතුමා කෙරෙහි කිසිදු දෙවි ගතියක්ද නැත. එතුමා අල්ලාහ්ගේ කීකරු අනවැසියෙකි. අවසාන වක්තෲවරයාද වේ.

අහස සහ පොළොව ඒවා අතරවූ සියළු දැහී නිර්මාතෲවරයා වූ සර්ව බලධාරි අල්ලාහ් මෙම ආගම ලබා දුන්නේ මිහිකතේ මුල්ම මිනිසා වන ආදම් තුමා වෙතය. මුල්ම මිනිසා වන ආදම් තුමා වෙත සර්ව බලධාරි අල්ලාහ් විසින් ප්‍රධානය කරන ලද සත්‍ය ආගම වන ඉස්ලාම් මුළු මානවයාගේම දහම වේ.

විශ්වයේ සියළු දේ මවන ලද්දේ අල්ලාහ් විසින් ය. එහෙයින් මැවීම්වලට හිස නොනමා එකම

එක පරම පිවිතුරු මැවුම් කරුවා වන සර්ව බල ධාරී දෙවියා පමණක් වැඳිය යුතු බව ඉස්ලාම් පවසයි. එසේම මිනිසා උදව් උපකාර පැතිය යුත්තේද ඔහු වෙතින්ය. එමෙන්ම මිනිසාගේ ප්‍රාර්ථනාවන් සපල කරන්නේද අල්ලාහ්ය.

අවසාන වක්තෘවරයා වූ මුහම්මද් නබි තුමාගේ ප්‍රචාරයේ හරය වූයේද අල්ලාහ්ගේ ඒකීය භාවය කෙරෙහි විශ්වාස කිරීමෙහි මිනිසා උනන්දු කිරීම වේ. ඉස්ලාම් ආගමේ මූලික පදනම ද එය වේ.

<u>'ලාඉලාහ ඉල්ලල්ලාහ් මුහම්මදුර් රසූලුල්ලාහ්'</u> නම් මෙම වදන් පෙළ ඉස්ලාම්හී මුල්ම වගන්තිය වේ. ලාඉලාහ ඉල්ලල්ලාහ් තේරුම වැඳීමට සුදුසු දෙවියා අල්ලාහ් හැර අන් සත්‍ය දෙවියෙකු නැත යනුවෙන් වේ. කෙනෙකු මෙම වදන් පෙළ එහි කරුණු පැහැදී හිතාන්තව පිළිගෙන ප්‍රකාශ කිරීමෙන් මුස්ලිම් කෙනෙකු බවට පත් වන්නේය. එසේ ප්‍රකාශ කිරීමෙන් හෙතෙම තම ජීවිතයේ ප්‍රගතියක්ද විශිෂ්ට ජය ග්‍රහණයක් සහ සන්තුෂ්ටියක්ද, මෙලොවෙහි පමණක්

නොව එලොවෙහිද ඇතිවන අතර, එසේ විශ්වා ස නොකර සිටීමෙන් තිමක් නැති එලොව ජීවිතයෙහි අපකීර්තියට පත් අපරාජිතයෙකු බවට පත්වන්නේය.

මෙසේ මෙම වචන මාලාව ප්‍රකාශ කිරීමෙන් පමණක් විශිෂ්ට ජයක් ලබා ගැනීමට නොහැකිය. අල්ලාහ්ගේ ඒකීය භාවය පිළිගෙන මහුගේ ආඥාවන් මුහම්මද් නබි තුමාගේ අනුශාසනය අනුව ප්‍රායෝගික ජීවිතයෙහිද පිළිපැදිය යුතුය. එතුමාගේ ආදර්ශයෙන් තොර ඉස්ලාම් ආගමෙහි කිසිදු පුණ්‍ය කර්මයක් නැත. අනෙක, මුහම්මද් තුමා සාමාන්‍ය මිනිසෙකි. එතුමාට කිසිදු දිව්‍යමය භාවයක් නැත. එතුමා හට වැඳුම් පිදුම් නොකළ යුතුය. භාරහාර ඉදිරිපත් නොකළ යුතුය. එතුමා මගින් උදව් උපකාර නොපැතිය යුතුය. එතුමා මිනිසුන් අතර උසස් පුද්ගලයෙකි. අල්ලාහ්ගේ කීකරු අනවැසියෙකි. අල්ලාහ් එතුමා මගින් මෙම ආගම ලෝවැසියන් හට ප්‍රචලිත කෙළේය. එහෙයින් වැඳුම් පිදුම් සියල්ල අයත්විය යුත්තේ සර්ව බලධාරි වූ අල්ලාහ්ට පමණි.

මෙම ඒකදේව විශ්වාසය මිනිසා තුළ ආත්ම ගරුත්වයේ ඉතා උසස් තත්වයක් ඇති කරයි. සියළු දැහී බලය අල්ලාහ්ට ඇති බවත්, අල්ලාහ් හැර අන් කිසිවෙකුට හොඳක් හෝ නොහොඳක් කිරීමට නොහැකි බවත්, තම අවශ්‍යතාවනයන් පවා සපුරා ගැනීමට නොහැකි බවත්, කෙනෙකු හට ජීවිතයක් දීමට හෝ ආපසු ලබා ගැනීමට හෝ නොහැකි බවත්, බලපෑම් කිරීමට හෝ බල යක් පාවිච්චි කිරීමට හෝ වරමක් හෝ බලයක් හෝ නැති බවත් විශ්වාස කළ යුතුය.

අල්ලාහ් හැර අන් කිසිදු දෙයකට හිස නො නැමිය යුතුය. වන්දනාමාන කිසිවක් නොකළ යුතුය. උදව් උපකාර පතා යාචනාත්මකව ආයාච නයන් කළ යුත්තේ අල්ලාහ්ට පමණි. උදව් ඉල්ල න්නාගේ ආයාචනය මහු සවන් දෙන අතර මහු වෙත ආයාචනය කිරීමට අතරමැදියෙකුද අවශ්‍ය නැත. මිනිසාගේ සිත් තුළ ඇති බාහිර සහ අභ්‍යන්තර සියලු දේ මහු මනාව දනී.

යමෙකු අෂ්හදු අල්ලාඉලාහ ඉල්ලල්ලාහ් (වැඳීමට සුදුසු අල්ලාහ් හැර අන් දෙවියෙකු

නැතයැයි මම සාක්ෂි දරමි) යනුවෙන් ප්‍රකාශ කරන කළ, හෙතෙම සියලු ව්‍යාජ දෙවිවරුන්, පිළිම සහ දේවත්වයක් ඇති බව පවසන මිනි සුන් ද අත් හැර තම නිර්මාතෘවරයා සහ එකම දෙවියාවූ සර්ව බලධාරි අල්ලාහ් පිළිගන්නේය.

අෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු (මුහම්මද් තුමා අල්ලාහ්ගේ දාසයා සහ අවසාන වක්තෘවරයා බවත් සාක්ෂි දරමි) යනුවෙන් ප්‍රකාෂ කරන කළ මුහම්මද් තුමාගේ වක්තෘත්ව යද පිළි ගැනේ.

කෙනෙකු ඉස්ලාම් ආගම වැළඳගනීනම් එයට පෙර හෙතෙම කරුණු හයක් කෙරෙහි විශ්වාස කිරීම ඉතා වැදගත්ය. ඒවා මතු පවසන 'අර්කා නුල් ඊමාන්' (විශ්වාස යේ කුළුණු) වේ.

1. අල්ලාහ්ගේ ඒකියභාවය කෙරෙහි විශ්වාස කිරීම. (වැඳුම් පිදුම් කිරීමට, උදව් උපකාර පැතී මට, භාරහාර ඔප්පු කිරීමට, පව් සමා ඇයදීමට සහ පුණ්‍ය කර්මයන් කිරීමට එකම සුදුස්සා උප තක් හෝ විපතක් හෝ නැති අල්ලාහ් පම ණක් බව)

2. අල්ලාහ්ගේ සුර දූතයන් කෙරෙහි විශ්වාස කිරීම (මවුන් ආලෝකයෙන් නිර්මාණය කර ඇත මවුන් අල්ලාහ්ගේ කීර්තිය මත සදා මහු ප්‍රශංසා කරමින් මහුගේ ආඥාවන් ඉටු කරනා අතර කුසගින්න, පිපාසය, විඩාව, ආශාව, මනාපය හා අමනාපය, නින්ද සහ විවාහය වැනි මිනිස් හැඟීම්වලින් තොර අය වේ)

3. අල්ලාහ්ගේ ධර්ම ග්‍රන්ථයන් කෙරෙහි විශ්වාස කිරීම (විටින් විට ආගමික ග්‍රන්ථ පහළ වූ බවත්, ඒවා මිනිස් දෑතෙන් විකෘති වූ බවත්, එහි අවසාන දේව ග්‍රන්ථය අල්කුර්ආනය බවත්, මින් මතු දේව ග්‍රන්ථයක පහළ නොවන බවත්)

4. අල්ලාහ්ගේ වක්තෘවරු කෙරෙහි විශ්වාස කිරීම (කාලයෙන් කාලයට මිනිස් සමා ජයෙන් අල්ලාහ් විසින් වක්තෘවරු තෝරා ගත් බවත් එහි අවසාන වක්තෘ තුමා මුහම්මද් තුමා බවත්)

5. යුගාන්ත දිනය කෙරෙහි විශ්වාස කිරීම( කව දා හෝ මුලු මහ සක්වළයම විනාශ වන බවත් ඉන් පසු එළඹෙන අවසාන විනිශ්චය දිනයේ මෙලොව ජීවත්වූ සියළු දෙනා නැවත

පත පොවා විවෘත තීන්දුවක් සඳහා ඉදිරිපත් කරන බවත්)

6. දෛවය කෙරෙහි විශ්වාසය (සිදුවුනු සහ සිදුවිය හැකි සියළු දෙයක්ම අල්ලාහ්ගේ අනු දැනුම මත සිදුවන බව)

ඉහත සඳහන් කරුණු සත්‍ය බව විශ්වාස කර සර්ව බලධාරිවූ අල්ලාහ්ට කීකරු වී මහුගේ ආඥාවන් මුහම්මද් තුමාගේ ආදර්ශමත් මග පෙන්වීම මස්සේ ඉටු කළ යුතුය. නියම මුස්ලිම් වරයෙකු විය හැක්කේ එසේ කිරීමෙන් පමණි.

ඉස්ලාම් ආගම වැළඳ ගැනීම:

කෙනෙකු ඉස්ලාම් ආගම වැළඳ ගැනීමට නම් හෙතෙම ඉස්ලාම් ආගම කෙරෙහි නියමාකාර යෙන් පැහැදී තමා යටත්විය යුතු එකම දෙවියා වූ සර්ව බලධාරි අල්ලාහ් පිළිගෙන මහුගේ ආඥාවන් හට කීකරුවී ජීවත්වීමට අධිෂ්ඨාන කර මතු සඳහන් වන වදන් තෙපලිය යුතුය.

1. <u>'අෂ්හදු අල්ලාඉලාහ ඉල්ලල්ලාහ් වහ්දහු ලා ෂරීක ලහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු'</u>

නැමදීමට සුදුසු අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නැති ඉවත් මහු කේවල බවත් එකම දෙවියා වන මහුට කිසිවක සහ කිසිවෙකු ආදේශ (සමාන) නොකරන බවත්, තවද මුහම්මද් තුමා අල්ලාහ්ගේ කීකරු දාසයා සහ අවසාන වක්තෘ වරයා බවත් සාක්ෂි දරමි' යන්න එහි තේරුම වේ.

<u>ඉස්ලාම් ආගමෙහි අතිවාර්‍යය් ලෙස ඉටු කළ යුතු කරුණු පහ මතු සඳහන් වේ.</u>

1. <u>'අෂ්හදු අල්ලාඉලාහ ඉල්ලල්ලාහ් වහ්දහු ලා ෂරීක ලහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු'</u> යන සාක්ෂිය පැහැදීමෙන් ප්‍රකාශ කිරීම.

2. සෑම මුස්ලිම්වරයෙකුම <u>දෛනික පස්වතා සලාත්</u> නියමිත වේලාවන්හිදී ඉටු කළ යුතුය. කිසිදු හේතුවකින් සලාත් කිරීමෙන් වළකී සිටීම

ට නොහැකිය. ගමණක යෙදී සිටියදී හෝ රෝගාතුරව සිටියදී හෝ සලාත් කිරීමෙන් වළකීමට නොහැකිය. එම අවස්ථාවන්හී දී යම් යම් වරප්‍රසාධ සළසා ඇති හෙයින් පහසුව තකා ඒවා පිළිපැදිය හැකිය.

සෑම සලාතයට පෙරම වුළු (දොවනය) කළ යුතුය. වුළු කරනා පිළිවෙළ:

1. වුළු කිරීම පිනිස නිය්යා (අධිෂ්ඨාන) කර ගැනීම.
2. බිස්මිල්ලාහිර් රහ්මා නිර්රහීම් කියා වුළු කිරීමට පටන් ගැනීම.
3. ප්‍රථම දැත් මැණික් කටුව දක්වා තුන් වරක් සේදීම.
4. කට සහ නාසය තුන් වරක් සේදීම.
5. මුහුණ සම්පූර්ණයෙන් තුන් වරක් සේදීම.
6. දැත් වැලමිට ඇතුළුව තුන් වරක් සේදීම.
7. හිස කෙස් කන් පෙති එක් වරක් තෙත් අතින් පිරිමැදීම.

8. දෙපා වළලු කරය ඇතුළුව තුන් වරක් සේදීම.(මුලින් දකුණ පසුව වම) මේවා පිළි වෙලින් කිරීමට අමතක නොකළ යුතුය)

<u>වුළු නිෂ්ඵල වන කාර්‍යයන්:</u>

1.වාතය පිටවීම

2. මල මූත්‍රා පිටවීම

3. නද නින්ද

4. මටු මස් අනුභව කිරීම

වුළු දොවනයට පෙර සම්පූර්ණ දේහ සුද්ධියක් අවශ්‍ය වේ. එවැනි දේහ සුද්ධියක් අවශ්‍ය වන් නේ මතු සඳහන් අවස්ථාවන් හීදීය.

1. සිහිනෙන් හෝ අන් ක්‍රමයකින් ධාතු පිටවීම.

2. කායික සංසර්ගය (ධාතු පිට නොවුවද)

3. කෙනෙකු ඉස්ලාම් ආගම වැළඳ ගැනීම

4. ස්ත්‍රීන්ගේ මාසික මසළ වීම.

5. ස්ත්‍රීන්ගේ ප්‍රසූති රුධිරය පිටවීම.

<u>සලාත් ඉටු කළ යුතු වේලාවන්:</u>

1. ෆජ්ර් සලාත් අළුයම රක්අත් දෙකයි.

2. ලුහර් සලාත් දවල් රක්අත් හතරයි.

3. අස්ර් සලාත් පස්වරු රක්අත් හතරයි.

4. මඃරිබ් සලාත් සවස රක්අත් තුනයි.

5. ඉෂා සලාත් රාත්‍රිය රක්අත් හතරයි.

(වැඩි විස්තර පිණිස සලාත් පොත බලන්න)

3. අනිවාර්‍ය්‍ය Zසකාත් බද්ද ගෙවීම වේ. යමෙකු හට ඉස්ලාම් පවසන්නාවූ ප්‍රමාණයට වඩා ධේසත් වේ නම් (රන්, රිදී, වෙළඳ භාණ්ඩ පශු වර්ගයේ සතුන් මුදල් සහ අනෙකුත් වටිනා දේ) අවුරුද්දක් මුළුල්ලේ එක් තැනක වේ නම් එ යින් සියයට 2.5 ක වාර්ෂිකවළම බද්ද ලැබීමට සුදුසු අය වෙත ප්‍රධානය කළ යුතුය. මෙම බද්ද පුදන කළ මෙහෙතෙම ලෞකික ලාභ යක් බලාපොරොත්තු නොවිය යුතුය. යම් යම් වෙළඳ භාණ්ඩ හා කෘෂිකාර්මික දේ නිෂ්පාදන යේ වැයවීම් අනුව එහි සකාත් ද වෙනස් වෙයි.

4. රාමසාන් මාසයේ උපවාස ශීලයෙහි යෙදීම.

ඉස්ලාමීය අවුරුද්දේ රාමසාන් මාසයේ අළුයම ෆජ්ර් සලාත් වේලාවේ සිට ඉර බැස යන මඃරිබ් වේලාව දක්වා නිරාහාරව හා කායික සංසර්ග යෙහි යෙදීමෙන්ද ඇත්වී සිටීමෙන් අල්ලාහ් මබ භක්තිවන්ත භාවය උරගා බැලීම පිණිස උප වාස ශීලය මබ වෙත අනිවාර්යය කර ඇත.

5. <u>හජ් කිරීම.</u> මෙම කර්තව්‍ය කිරීම පිණිස අධාල මුදලක් හා ශරීර සුවයක් වේ නම් ජීවි තයේ එක් අවස්ථාවක් සුද්ධවූ මක්කා නගර යෙහි වූ අල්ලාහ් වැඳීම පිණිස ඉදිකරණ ලද මුල්ම සුද්ධවූ මැදුර වන මස්ජිදුල් හරම් වෙත ගොස් එම කර්තව්‍ය ඉටු කිරීම. ලේනෑයන් හෝ තම ස්වාමියා හෝ නොමැතිව මෙම කර් තව්‍ය ස්ත්‍රීන් හට අනිවාර්ය නොවේ.

පෙර සඳහන්වූ සියළු ආගමික වත් පිළිවෙත් සඳහාම මුහම්මද් තුමාගේ පෙර ආදර්ශයක්වේ. එතුමාගේ ආදර්ශයෙන් හා අනුශාසනයෙන් තොර කරනා කිසිදු පුණ්‍ය කර්මයක් අල්ලාහ් විසින අනුමත නොකරනු ලබන බව තරයේ සිතේ තබාගත යුතුය.

සෑම මුස්ලිම්වරයෙකුම පෙර සඳහන් ප්‍රකාර යට ක්‍රියා කළ යුතු අතර සුරා, සූදු, මුසාවාද, දුරාචාර සහ අනෙකුත් පාපකර්මයන්ගෙන් වළකී සිටිය යුතුය. තම මුස්ලිම් සහෝදරයෙකු අල්ලාහ්ගේ අණ ඉටු නොකර නොසැළකිල්ලෙන් සිටීම නිසා අපද මහු අනුගමනය කිරීමට උවමනා නැත. හැකිතාක් අයුරින් කුසල් කර්මයන්හී නියැළී, අනුන් අනුගමනය කිරීමෙන් වළකී අල්ලාහ්ට සහ නබි තුමාට කීකරුවීමට වග බලා ගත යුතුය.

අනෙක අල්කුර්ආනය මුස්ලිම්වරුන්ගේ ආගමික ග්‍රන්ථය වේ. එය මිනිස් දැනෙන් නිමවූ එකක් නොව. විශ්ව මානවයාගේ ප්‍රගතිය අර භයා සර්ව බලධාරි අල්ලාහ් විසින් අවස්ථාවෝචිතව පුරා අවුරුදු විසිතුනක් ඇතුලත පහළ කරන ලද දිව්‍යාඥාවක් වේ. අල්කුර්ආනය පහළ වී දැනට අවුරුදු 1420ක් පමණ ගතවූ වද එය කිසිදු අඩු වැඩි වීමක් වෙනස්වීමක් හා විකෘති වීමකින් තොරව පහළවූ ප්‍රකෘතියෙන්ම අද වන තුරු පසුවන අතර මතුවටද එය විකෘති නොවන්නේය.

කෙනෙකු නියම මුස්ලිම්වරයෙකු වීමට නම් මුහම්මද් තුමාගේ අනුශාසනය අනුව ක්‍රියා කිරීමෙන් වීනා අනුන් ආදර්ශයට ගැනීමෙන් නොවන බව තරයේ අධිෂ්ඨාන කරගත යුතුය. ඉස්ලාම් ආගම ගැන මනා අවබෝධයක් ලබා ගනු වස් එහි පොත්පත් සහ ලිපි කියවීමට උත්සාහ දරනා අතර ඉස්ලාම් ආගමේ පණිවුඩය අන් අය හට ද දැන ගැනීම පිණිස ක්‍රියා කළ යුතුය.

සියල්ල දන්නේ අල්ලාහ් පමණි.



(Prepared by: *Aboo Shaira Momamed Hussain*)

تم بعون الله وتوفيقه ترجمة وأصدار هذا الكتاب
**بالمكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بحي الروضة**

**تحت اشراف وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد**

الرياض ١١٦٤٢ ص.ب ٨٧٢٩٩
هاتف ٤٩١٨٠٥١ فاكس ٤٩٧٠٥٦١

يسمح بطبع هذا الكتاب واصدارتنا الأخرى بشرط عدم التصرف في أي شيء ما عدا الغلاف الخارجي.

**حقوق الطبع ميسره لكل مسلم**

# دين الإسلام

تأليف

أبو شاعره محمد حسين

سنهالي

ردمك ٩٩٦٠-٩١٩٣-٦-٦

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بسلطانة
تحت إشراف وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد
هاتف: ٤٢٤٠٠٧٧ ناسوخ: ٤٢٥١٠٠٥ ص ب ٩٢٦٧٥ الرياض ١١٦٦٣ بريد إلكتروني E.mail : Sultanah22@hotmail.com
THE COOPERATIVE OFFICE FOR CALL & FOREIGNERS GUIDANCE AT SULTANAH
Tel:4240077 Fax:4251005 P.O.Box:92675 Riyadh:11663 K.S.A. E-mail: sultanah22@hotmail.com